රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

# ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය

# තනතුරු පුරප්පාඩු

**රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ පහත තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| | | |
|---|---|---|
| තනතුර | - | **පර්යේෂණ විශ්ලේෂක (පුරප්පාඩු 01)** |
| **මාසික දීමනාව** | - | **මූලික වැටුප රු.53,150.00 + ජීවන වියදම් දීමනාව රු.7,800.00 = රු. 60,950.00** |
| අධ්‍යාපන සුදුසුකම් | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන ජාත්‍යන්තර සබඳතා / සාමය හා ගැටුම් නිරාකරණ අධ්‍යයනය / ආරක්ෂක අධ්‍යයනය / බුද්ධි සේවා අධ්‍යයනය / ත්‍රස්තවාදය / සමාජ විද්‍යාව / දේශපාලන විද්‍යාව / නීතිය / ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් හා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| පළපුරුද්ද | - | පර්යේෂණ කටයුතු සම්බන්ධව වන ක්ෂේත්‍රයකින් ලබාගත් අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් සහිත වීම. |
| වයස | - | අවු. 21ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුයි. |
| බඳවා ගැනීමේ ක්‍රමය | - | යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. |

- සියලුම අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයේදී ඉංග්‍රීසි භාෂා හැකියාව මැන බැලීම සඳහා විනාඩි 30 ක ලිඛිත පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය.

- ඉහත තනතුරුවලට අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් තම අයදුම්පත් 2022.02.28 දිනට හෝ ඊට ප්‍රථම **ලේකම්, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය, බිම් මහල, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර, නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවද දන්වමි.

- වැඩිදුර විස්තර සඳහා **www.defence.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.

ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය,
බිම් මහල,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.